# කෙටි කතාව



ප්‍රවීණ ලේඛක
ජයතිලක කම්මැල්ලවීර



## ඔහු මා වැළඳගත්තේය

මම දවස් දෙකක් රැකියාවට නොයා මගේ කිට්ටු ම අසල්වැසියා වන දේනෙත්ති සමඟ එක්වී රූපවාහිනියෙන් ක්‍රිකට් මැච්එක බැලුවෙමි. දේනෙත්තිත් මාත් එකම පාසලේ එකම පන්තියේ ඉගෙන ගත් ඒ කාලයේ ම එක ම විදියට ක්‍රිකට් පිස්සුව වැළඳුණු පසුකාලීනව එක ම වෙන්දේසිය කින් එක ළඟ ඉඩම් කෑලි දෙකක් මිල දී ගෙන එකට යා කර ගෙවල් හදා ගත් අඹ යාළුවන් වන්නෙමු. අපේ ටීම් එක මැච් එක පරාජය වීම ගැන කේන්තිය හිත දරාගෙන අද මා වැඩට ආ විට කාර්යාලයේ ලොක්කා මගේ ඇඟට ගොඩවිය.

"අයිසේ සුරංග, ඔයා ඔයාට හිතෙන හිතෙන විදියට නිවාඩු ගත්තම මේ ඔෆිස්එක රන් කරන්නෙ කොහොමද? අපි ක්ලයන්ට්ස්ලට වග කියන්න ඕනනෙ."

"සොරි මට කලින් ලීව් ඇප්ලයි කරන්න බැරිඋනා තමයි ඒත් මගේ නිවාඩු ඉතුරු වෙලා තියෙනව." යැයි ලොක්කාට කී මම 'ඕනකමකට නිවාඩුවක් ගන්න බැරි නං මෙතන වැඩ කරන එකේ තේරුමක් නෑනෙ යැයි මට ම කියා ගතිමි.

"ලෝකෙ කොහේහරි ගහන මැච් එකක් ටීවී එකේ පෙන්නනව නං එදාට ඔය ගොල්ලන්ට හදිස්සි ලෙඩක් නැත්නං ගෙදර හදිස්සි වැඩක්."

"හදිස්සියකට නිවාඩුවක් ගත්තට මම මගේ වැඩ අතපසු කරල නෑ"

"හරි හරි, අර හදිස්සි වැඩ ටික ඉවර කරල දානව." ලොක්කා තරමක් නුවුණු ස්වරයෙන් එ සේ කීවද කාර්යාලය ගැනත් මේ රස්සාව ගැනත් මගේ සිත යට කලක් තිස්සේ පවතින කලකිරීම වැඩෙන්නට මේ සිද්ධිය ද පොහොරක් විය. මම මගේ මේසය වෙත ගොස් කොම්පියුටරයේ ස්විචය ඔබමින් ම පුටුවේ වාඩිවූයෙමි. එහෙත් වැඩ කිරීමට හිත එකලාසයක් කර ගැනීම අපහසු ය.

'ගතවූ දින දෙකේත් මොහොතකට පෙර කාර්යාලයේදීත් මා හැසිරුණේ මෝඩයෙකු හැටියට නොවන්නේ ද? ක්‍රිකට් මැච් නොබලා හිඳින්නට බැරි ලෙඩක් මට තිබෙන බව ඇත්තකි. එහෙත් නිසි පරිදි නිවාඩු ඉල්ලා එය කළේ නම් ලොක්කාගෙන් වචනයක් අහන්නට සිදු වන්නේ නැහැ නේද? මේ වෙලාවේ රස්සාවට ලෙඩක් වැටුනොත් මහා කරදරයක් නිර්මාණය වෙනවා නේද? එහෙම උනොත් එවිට අපේ ටීම් එක වර්ල්ඩ්කප් ෆයිනල් ගැහුවත් ඒක නොබලා රස්සාවල් සොය සොයා තැන තැන ඇවිදින්නටත් ඒ ඒ තැන්වල ලොක්කන් ඉදිරියේ දෙකට නැවෙන්නටත් සිදුවෙනවා නොවේද?

'මේ පිස්සු කොම්පියුටරය පැයකින් නිදගන්නේ ඇයි?' මම කෑම වෙලාව එනතෙක් හතර වතාවක් කොම්පියුටරය ඔන් කළත් වැඩ කරන්නට හිතක් උපදවා ගන්නට මට නොහැකි විය. පුරුදු බාර් එකට ගොස් හීන් අඩියක් ගැහැව්වොත් හිතට සහනයක් ලැබෙනු ඇතැයි සිතූ මම හරියට ම දවල් දොළහට කාර්යාලයෙන් පිටවීමි.

බාර් එකේ මුල්ලක කුඩා මේසයකට වාඩි වී ඩබල් ඩිස්ට්‍රිල් සීයක් සහ බයිට් එකක් ඕඩර් කළ මම දන්නා හඳුනන කිසිවකු බාර් එක ඇතුලේ සිටින්නේදැයි දැන ගැනීමට හොඳින් වට පිට බැලුවෙමි. ඒ බැලිල්ල,

'මේ වෙලාවේ මට මෙතන තනියම ඉන්නට කාගෙන්වත් බාධාවක් නොවේ වා' යන ප්‍රාර්ථනාවෙන් යුක්ත විය. ටයි කෝට් හැඳි වැඩිහිටි මහත්මයකු සහ තවත් මා ජීවිතේට දැක නැති හතර දෙනෙකුය මෙහි සිටින්නේ. එය ම මොනතරම් සහනයක්ද? මට ම හරිහැටි පැහැදිලි නැති මගේ ගැටලුව මට තනිව ම මත්පැනින් සෝදා හැර හිත නිදහස් කරගන්නට පුළුවන. එසේ හිත පිරිසිදු කරගෙන කාර්යාලයට ගොස් පුරුදු පරිදි වැඩ කිරීමේ අපේක්ෂාවෙන් මම ප්‍රථම උගුර බිව්වෙමි.

හිත රවටා ගන්නට කුමක් හෝ හේතුවක් සොයාගෙන කෑම විවේකයේදී හීන් අඩියක් ගහන්නට මේ බාර්එකට ඒම දැන් පුරුද්දකට හැරෙමින් තිබෙන බව මට ම දැනෙයි. මිනිසුන් බේබද්දන් බවට පත්වන්නේ මෙවැනි තැනකින් පටන් ගෙන ටිකෙන් ටික නොනැවතී ඉදිරියට යාමෙන් බව ද මම දන්නෙමි. බීම වීදුරුවට නියපිටින් තට්ටු කරමින් මම බිරිඳට දරු දෙදෙනාට දෙමාපියන්ට ඉටුකරන්නට ඇති වගකීම් මෙනෙහි කරන්නට පටන් ගත්තේ සතියට දෙවරක් බවට පත් වී ඇති මේ 'දුසිරිතෙන්' මිදෙන්නට මඟක් සොයමිනි.

මේ බාර්එකට කිසිසේත් නොගැලපෙන ඉංගීසි ගීතයක් පහත් හඬින් එහෙත් ගැඹුරු ස්වරයකින් ඇසෙන්නට වූයෙන් මට නැවත වටපිට බලන්නට සිදුවිය.

ගීතය ගයන්නේ ටයි කෝට් හැඳ සිටින වැඩිහිටි පුද්ගලයා ය. පුටු ඇන්දට බරවී, හිස පිටුපසට බර කර ගෙන, දෑස් පියාගෙන ඔහු ගයන්නේ තමා වෙනුවෙන් ම පමණක් බව පෙනෙන නමුත් ඒ ගැයුම මටත් ඇසෙ යි. එය හොඳ පුහුණුවක් ඇති ගැයුමකි. හොඳින් නිරීක්ෂණය කළ විට ඔහු වාඩි වී සිටින මේසය මත බයිට් පිඟානක් ද අඩක් නිම කළ වීදුරුවක් ද සිගරැට් පැකට්ටුවක් ද මේසය අසල බිම ලොකු ගමන් බෑගයක් ද ඇති බව මම දුටුවෙමි.

මම ද මොහොතකට දෑස පියාගෙන ඔහුගේ ගීතයට සවන් දුන්නෙමි. මගේ සිතේ අවුල මත්පැනින් ඉවත් නොවුණ ද ගී හඬින් මො හොතකට යටපත් විය.

ගීතය ගයා අවසන් කළ ඔහු හිස ඔසවා වට පිට බැලුවේය. වීදුරුවෙන් උගුරක් බී සිගරැට්ටුවක් දල්වා ගත්තේය. කෝට් සාක්කුවෙන් ජංගම දුරකථනයක් ගත්තේ එය හැඬවෙන්නට පටන් ගත් නිසා බව පෙනිණ. කෙටි සංවාදයකින් පසු එය යළිත් සාක්කුවේ දමා ගත්තේය. ඔහු දුරකථන සංවාදයේ අවසන් වචන තරමක් උස් හඬින් කී බැවින් මට ද ඒවා ඇසිණ.

"බිලීව් මී. ෂුවර්, ඩෙෆිනිට්ලි අයි විල් මේක් ඉට් ටුඩේ." මම මගේ දෑස ඔහු වෙතින් ඉවත් කර ගෙන නැවත මගේ ලෝකයට ආවෙමි. එහි තවමත් කැරකෙන්නේ පරණ සිතිවිලි ම ය. නළල තෙරපමින් හිඳ හිස ඔසවන විට යළිත් දෑස යොමු වුණේ



ටයිකෝට් ජෙන්ට්ලිමන් වෙත ය.

"හලෝ" ඔහු මා වෙත සුහද සිනාවක් පෑවේය.

ආචාරධර්ම නොදන්නා නරුමයකු වීමට අකමැති බැවින් මා ද යන්තමින් සිනාසී "හලෝ" වලින් ප්‍රතිචාරයක් දැක්වුව ද මේ මොහොතේ කිසිවකු සමඟ සංවාදයකට මා සූදානම් නැති බව පෙන්වමින් වහාම ඉවත බලාගත්තෙමි.

කෙනෙක් සුහදතාවක් පෙන්වූ විට මා හැ සිරිය යුත්තේ එ සේ ද? මෙහි සිටින අනෙක් අය හා සසඳන විට ඔහු විශේෂ කෙනෙකු බව පෙනේ. ඔහුට ඒ මා දැක්වූ ප්‍රතිචාරයට වඩා සුහද, විනීත ප්‍රතිචාරයක් දැක්විය යුතුව තිබුණා නේද? එහෙත් මා එ සේ කළේ මේ මොහොතේ කිසිවකු සමඟ කතාබහකින් වැළකී සිටින්නට සිතා සිටි බැවිනි. බාර් එකකදී තනිව ම බිබී ඉන්නා කෙනෙක් 'හලෝ' කියන්නේ ලැබෙන ප්‍රතිචාරය හොඳ නම් තම මත්බඳුන ද සමඟ අවුත් මගේ මේසයට වාඩිවෙන්නට බව මම අත්දැකීමෙන් දන්නෙමි. ටික වේලාවකින් එ සේ ආ තැනැත්තා ගැලවී යන්නට අපහසු වන 'කොහොල්ලෑ මිත්‍රයකු' බවට පත්වෙයි.

එහෙත් මොහු එවැන්නකු වන්නට බැරිය. මෙවැනි බාර් එකකට පැමිණ සිටිය ද මොහු කිසිවකුට කරදරයක් නොවන්නට හැසිරෙන්නට හොඳ පුහුණුවක් ඇති මහත්මයකු බව පෙනේ. නැවතත් ඔහු මා දෙස බැලුවොත් මිත්‍ර ලීලාවක් පෑ යුතු යයි සිතා ඔහුට ම ඉලක්ක කළ බැල්මක් හෙළුවෙමි.

"කම් මිස්ටර්, වයි ඩෝන්ට් යූ කම් හියර් ඇන්ඩ් ජොයින් මී." යැයි කී ඔහු යළිත් ගායනයක් පටන් ගත්තේය. මම වේටර්වරයා කැඳවා මගේ වීදුරුව සහ බයිට් එක ඒ මේසයට ගෙන යන්නැයි කියා නැඟිට ගොස් ඔහු ඉදිරියෙන් වාඩිවීමි. මා පැමිණි බව දැනුණත් ඔහු දිගට ම ගයයි. ඔහුගේ පෙනුම ද ගැඹුරු කටහඬ ද මා තරමක් අතීතයට අදින බවක් දැනෙන්නට විය. මොහු මා දැක පුරුදු කෙනෙක් නේද? කවුද? කොහේදී ද?

ඔහුගේ ගායනය අවසන් වන්නට පෙර මගේ මතකය විසින් වර්ණ දියවී කටු සටහනක් බවට පත්ව ඇති පැරණි චිත්‍රය යළි වර්ණ ගන්වා පෙන්වූයෙන් අතීතයේ ඒ ප්‍රතාපවත් චරිතය මට සිහිපත් විය. 'වර්නන් මෙන්ඩිස්' අප පාසල් යන කාලයේ අපේ ලොකුම වීරයා වූ ක්‍රිකට් විස්තර ප්‍රචාරකයා සහ ඉංග්‍රීසි නිවේදකයා.'

ඔහුගේ පෙනුමට, ගැඹුරු කටහඬට, උච්චාරණයට අප වශී වී සිටි හැටි මට මතක් විය. ක්‍රිකට් තරඟයක් විස්තර කරන්නට රූපවාහිනී කැමරාව ඉදිරියේ වාඩි වන වර්නන් මෙන්ඩිස් එය ආරම්භ කරන වාක්‍යය අනුකරණය කරන්නට අපි පුරුදු වී සිටියෙමු.

'වෙරි ගුඩ් මෝනිං එව්රිබොඩි, වට් එ ෆයින් මෝනිං අයිඩීයල් ඩේ ෆෝර් එ සුපර් ගේම් ඔෆ් ක්‍රිකට් ....'

මගේ ඔළුවේ කලින් තිබූ සියල්ල ඉවතට තල්ලු වී වෙනත් දෙයකින් එය පිරෙමින් තිබේ. 'මොහුට කුමක් වී ද? වසර දහයක දොළහක කාලයක් මොහුගේ රුව රූපවාහිනී තිරය මත දකින්නට නොලැබිණ. අප සිතා සිටියේ මොහු බීබීසියේ හෝ වෙනත් විදේශ මාධ්‍ය ආයතනයකට සම්බන්ධ වී රටින් බැහැර යන්නට ඇතැයි කියා ය. මේ දැන් මා ඉදිරියේ සිටින්නේ එදා මා බෙහෙවින් ඇළුම් කළ වීරයාගෙන් කාලකි. එදා අභිමානයෙන්





ඔද වැඩුණු මුහුණ අද වැහැරී ගොසිනි. එකල ඔහුගේ පිරිපුන් සෑජු කයට කදිමට ගැලපුණු ඉංග්‍රීසි ඇඳුම් කට්ටලය අද ඔහුට ගෙන දී ඇත්තේ චාලි චැප්ලින් පෙනුමකි. මොහුට කුමක් වී ද?'

"ඔයා ඉන්නෙ අප්සෙට් මූඩ් එකෙක නේද?" ඔහු ඇසූ ඒ ප්‍රශ්නය මා ලජ්ජාවට පත් කළ ද තවමත් ඉතිරිව ඇති ඔහුගේ ගැඹුරු හඬ මගේ හැඳිනගැනීම නිවැරදි බව තහවුරු කළේය.

"මිස්ටර් වර්නන් මෙන්ඩිස් නේද?" ඔහුගේ ප්‍රශ්නය නොඇසුණා සේ මම ඇසුවෙමි.

"ඔයා එහෙනං මාව අඳුන ගත්ත."

"දැන් තමයි අඳුන ගත්තෙ"

එය මදි යැයි සිතූ මම මෙ සේ ද කීවෙමි.

"සොරි, මම කලින් අඳුන ගත්තෙ නෑ."

"මාව දැන් කවුරුවත් අඳුනගන්නවට මම කැමති නෑ. හරි, කමක් නෑ දැන් ඔයා මාව අඳුන ගත්තනෙ. මා ගානෙ පොඩි ඩ්‍රින්ක් එකක් ගමු."

ඒ වන විට මා සිටියේ මගේ මතකයේ වූ දැවැන්ත ප්‍රතිරූපය ඉදිරියේ වූ බැවින් මට ඔහුගේ යෝජනාව ප්‍රතික්ෂේප කළ නොහැකි විය. ඔහුගේ ඇනවුමෙන් අඩක් පිරවූ ලෙමන් ජින් වීදුරු දෙකක් ද සෝඩා බෝතලයක්ද මස් පීරිසියක් ද මේසය මත තැබිණ.

"ගමු.... චියර්ස්."

"මිස්ටර් මෙන්ඩිස් පහුගිය කාලෙ ඉන්න ඇත්තෙ එබ්‍රෝඩ් වෙන්න ඇති නේද?"

"නෑ. හිටියෙ නං මෙහේ ම තමයි"

"කාලෙකින් ටීවී එකේ දැක්කෙ නෑ."

"ඒව අත්ඇරල බොහොම කල්. යූ ආර් මිස්ටර්?"

"මම සුරංග."

"මම ආයෙත් කියන්නන්කො සුරංග, අද කවුරු හරි මාව වර්නන් මෙන්ඩිස් හැටියට අඳුන ගන්නවට මම කැමති නෑ. ඒ හින්ද තමයි මම ඩ්‍රින්ක් එකක් ගන්ඩ මෙතෙන්ට ආවෙ."

ඔහු මිස්ටර් කෑල්ල අතහැර කෙලින් ම මට කතා කරන්නට විය. එය මිත්‍රත්වයට අත වනන සංඥාවකි. මට සතුටක් මෙන් ම සැහැල්ලුවක් ද දැනිණ. එඩිතර කමක් ද ආවේශ විය. මම ඉතිරි ජින් ටික එක උගුරට ඇද ප්‍රතිරූපය ඉදිරියේ හරිබරිගැසුණෙමි.

මත්පැන් සියුම් කිතියක් බවට හැරී ඇඟ පුරා දුවන බව මට දැනෙන්නට විය.

"සර් කොහේ හරි ගමනක් යන ගමන්ද?" ඔහුට හොඳහැටි පෙනෙන්නට ඔහු ළඟ ඇති ගමන් මල්ල දෙස බලා මම ඇසුවෙමි.

"ඔව් යන්ඩ ඕන. කොහේ හරි යන්ඩ ඕන"

අත් ඔරලෝසුවෙන් වෙලාව බැලූ ඔහු "ඔව් තව ටිකකින් කොහේ හරි යන්ඩ ඕන." යයි කියා තම ජින් වීදුරුව හිස් කළේය. ඉන්පසු ඔහු තවත් ගීතයක පද දෙකක් ගායනා කරන්නට විය. මත්පැන් යම් පමණකට මගේ මොළයේ ක්‍රියාකාරීත්වයට බලපෑම් කරමින් තිබුණ ද 'ඔව් යන්ඩ ඕන කොහේ හරි යන්ඩ ඕන' යන වචනවලින් ඔහු අදහස් කළේ කුමක්දැයි වටහා ගන්නට මම උත්සාහ කළෙමි. මිස්ටර් වර්නන් මෙන්ඩිස් මට වඩා වෙරි වී සිටින්නේ ද? නැතහොත් ඇසෙන දෙයක දෝංකාරය මිස අරුත නො වැටහෙන පදමට මා පත්ව සිටින්නේ ද?

"දැන් කවුරුහරි මෙතනට කඩාපැනල මට වෙඩි තිබ්බොත් සුරංග මොකද කරන්නෙ?"

මේ දකින්නේ හීනයක්දැයි සිතෙන තරමට මම අන්ද මන්ද වීමි. මගේ වෙරි හිඳිණ.

"සර් මේ මොනවද කියන්නෙ?"

"පුදුම වෙන්ඩ දෙයක් නෙමෙයි සුරංග ඒක වෙන්ඩ පුළුවන්."

ඔහුගේ ජංගම දුරකථනය හැඬවෙනු ඇසිණ. එය අතට ගෙන "හලෝ" කියමින් ම ශබ්ද නොකරන්නැයි ඔහු මට සන් කළේය.

"ඔව් ඔව් මම මේ එන ගමන්. තුනට මම ගල්කිස්සෙ. ඩෝන්ට් වොරි. බිලීව් මී. අයි විල් බී දෙයාර් ඔන් ටයිම්."

දුරකථනය සාක්කුවට දමා ගත් වර්නන් මෙන්ඩිස් දරුණු ප්‍රහාරයකට සූදානම් වූ බොක්සිං ක්‍රීඩකයකුගේ ඉරියව්වෙන් දෑත ද මුහුණ ද හදාගෙන ටික වේලාවක් හිඳ දසැඟිලි දිගහරිමින් නැවත හකුලමින් ව්‍යායාමයක යෙදුනේය. මට පෙනුණේ ඔහු කිසියම් අධිශ්ඨානයක් වෙනුවෙන් සිත දැඩිකර ගත් බවකි.

"තව සීයෙ දෙකක්."

ඔහු වේටර් ඇමතුවේය. මම පියවි සිහිය උපදවා ගන්නට උත්සාහ කරමින් "මට නං ඇති සර්" යයි කියා ගත්තෙමි.

"අයියෝ ඔයා තවම තරුණයෙක්නෙ. සමහර විට මේ මම ගන්න අන්තිම ඩ්‍රින්ක් එක වෙන්ඩ පුළුවන්. අපි ඒක බොමු."

මා ආපසු කාර්යාලයට යා යුතු බවත් හවස් වෙන්නට පෙර අවසන් කළ යුතු වැඩ කීපයක් ම ඇති බවත් හදිසියේ මට මතක් විය. එහෙත් මිස්ටර් වර්නන් මෙන්ඩිස් මා තුළ ඇවිස්සූ කුතුහලය හිඳ සිටින තැනින් නැඟිට ගන්නට බැරි තරමට බලවත් ය. වසර කීපයකට පෙර මාධ්‍ය ලෝකයත් ක්‍රිකට් ලෝකයත් තම පෞරුෂයෙන් වශී කර ගෙන සිටි දැවැන්ත චරිතයකට මේ සිදු වී ඇත්තේ කුමක්ද? ඒ මදිවාට මොහු මේ කියන්නේ මොනවාද? දැන් ඔහු ඔහුගේ ජීවිතයේ අවසන් මධුවිතට හවුල් වෙන්නට මට ආරාධනා කරයි.

"මට තව පැය බාගයයි තියෙන්නෙ. මම සුරංගට මං දැන් ඉන්න තත්වෙ කියන්නං. මේක කාට හරි කියල තියෙන එකත් හොඳයි. මේක ගමු."

දැනටමත් රැකියාව පරදුවට තබා ඇති බව මට සිහිවූ නමුත් අතීතයේ ගෞරවය විසින් ඔහුගේ ඉල්ලීමට මා යටත් කෙරිණ.

"දැන් සුරංගට ඇහුන නෙ මම තුනට ගල්කිස්සට එන්ඩ පොරොන්දු වෙනව. ඒ පොරොන්දුව ලක්ෂ අසූවක ණයක් ආපහු ගෙවන පොරොන්දුවක්. තුන්වෙනි වතාවටත් මම ඒ පොරොන්දුව කඩනව. තව ටිකකින් මම මෙතනින් කැබ් එකක් අරන් කොටුවට ගිහින් තියෙන කෝච්චියක හරි බස් එකක හරි නැගල කොහේ හරි යනව. දැන් අවුරුද්දක් තිස්සෙ මං ගෙවන ජීවිතේ ඕක තමයි. කට්ටි පැනල කට්ටි පැනල බැරිම තැන මීට මාස තුනකට කලින් එක ණයකට හිලව් වෙන්ඩ මගේ ගේ ලියල දුන්න. ඒකෙන් මගේ පවුලත් මට නැති උනා. දැන් අන්තිම වතාවට අද දෙන්ඩ පොරොන්දු වෙච්ච ලක්ෂ අසූව නොදුන්නොත් උන් මාව මරල දන බව ෂුවර්. දැන් රුපියල් පනස්දහටත් කුලියට මිනීමරන උන් ඉන්නවනෙ."

කැරකෙන්නේ මාව ද නැත්නම් බාර් එක දැයි තේරුම් ගන්නට නොහැකිව මම උඩ ද බිම ද වටපිට ද බලන්නට පටන් ගත්තෙමි. ඒ කැරකිල්ල අස්සේ වේටර් බිල ගෙන එනු ද මිස්ටර් වර්නන් එය ගෙවා දමනු ද මට දෙබිඩි ඡායාවන් සේ පෙනිණ. ඒ අතර මම අමාරුවෙන් ධෛර්ය උපදවාගෙන "මිස්ටර් වර්නන් ඇයි මේ තරම් ණය උනේ?" යයි ඇසුවෙමි.

"නොදන්න බිස්නස්, වෙනස් කර ගන්ඩ බැරි පුරුදු" එ සේ කී ඔහු දුම් උගුරක විරාමයක් ගත්තේය. "ඔයා දන්නවනෙ ඒ දවස්වල මම මීඩියා පර්සනැලිටි එකක් නෙ. මා වෙනුවෙන් වියදම් කරන්න සල්ලිකාරයෝ ඕන තරං හිටිය. මගේ මිත්‍රයෙක් යෝජනා කළා බිස්නස් එකක්. මිනිහවත් හවුල් කරගෙන මම පටන් ගත්ත. අන්තිමට මාව ණයකාරයෙක් කරල මිනිහ මාරු උනා. මිනිහෙක් බිස්නස් කරනව නං ඒවට කැප වෙන්න ඕන. එහෙම නැති වුනොත් දන සල්ලි දියවෙනව අයිස් වගේ. අනිත් එක මට පරම්පරාවෙන් ආපු නරක පුරුදු ගණනාවක් තිබුණ. රජෙක් වගේ හැසිරෙන එකයි තනියම බොන්න බැරි එකයි ඒවයින් දෙකක්. රජවරුන්ට අන්තඃපුරත් තිබ්බ්ච බව ඔයා දන්නවනෙ. කොහොම හරි දැන් මම ඉන්නෙ මාරයගෙ කටේ." ඔසවා කටට ඇලකළ හිස් වීදුරුව ශබ්ද නගා මේසය මත තැබූ ඔහු නැඟිට ගමන්මල්ල අතට ගත්තේය.

"මා එක්ක ටිකක් කතා කර කර හිටියට තෑන්ක් යූ සුරංග."

"ගෝඩ් බ්ලෙස් යූ සර්."

එ සේ කියමින් මා ද නැඟී සිටි විට "ගෝඩ්, ගෝඩ්, ගෝඩ්" යයි කියමින් හඬනගා සිනාසුණු ඔහු ගමන් මල්ල බිම තබා මා වැළඳ ගත්තේය. එය බීමත් වැළඳග ැනීමක් උව ද මට එය බෙහෙවින් උනුසුම් විය. අද කුමන තත්වයකට පත්ව සිටියද ඒ මා වැළඳ ගත්තේ අපේ ලෝකයේ සිටි දැවැන්තයෙකි.

෴ ෴

"බොරු කියන්ඩ එපා සුරංග." දේනෙත්ති මා විශ්වාස නොකරයි.

"මම කියන්නෙ සම්පූර්ණ ඇත්ත. අපි දෙන්න ඩ්‍රින්ක් එකක් ගත්ත. යන්ඩ නැගිටල වර්නන් මෙන්ඩිස් මාව බදාගත්ත."

"නෑ!"

"නෑ නෙමෙයි, සම්පූර්ණ ඇත්ත"

"දැන් මොකද මිනිහ ටීවීවල පේන්ඩ නැත්තෙ? උඹ ඇහැව්වෙ නැද්ද?"

"ඒව අහන්නෙ කොහොමද, මිනිහව හම්බ වෙලා කතාකරන්න ලැබුණාම මම කැරකිලා හිටියෙ. උඹට මතක ඇතිනෙ ඉස්සර අපි මිනිහට මාර ලව්නෙ. මතකද? වෙරි ගුඩ් මෝනිං එව්රිබොඩි, වට් එ ෆයින් මෝනිං අයිඩීයල් ඩේ ෆෝර් එ සුපර් ගේම් ඔෆ් ක්‍රිකට්"

"කොහොමද මනුස්සය තවමත් කුල්ටූර් ද?"

"කියල වැඩක් නෑ. ඒ විදිහමයි. මිනිහ මාව හග් කළේ ඒ වෙලාවෙ ටීවී ස්ක්‍රීන් එකෙන් බැහැල ආව වගේ"

**මා එසේ කියන විටත් අපේ වීරයා කුලී මිනීමරුවකුගේ වෙඩිපහරකින් මැරී වැටී සිටින්නට බැරි නැතැයි සිතෙන් නට වූයෙන් පොඩි අඩියක් ගහන්නට දේනෙත්ති කළ ආරාධනය ප්‍රතික්ෂේප කළ මම ගෙදර අවුත් ඇඳට වැටුනෙමි.**

6 මට හැඟෙන අයුරින් සිකොලොජිය
rasikalogy.blogspot.com

## ඔබතුමා, වැසිකිළි සහ රටේ දියුණුව

### Your Honour, Toilets and Becoming a developed country

කලකට ඉහත ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර ධනපති රටවල් සහ රුසියාව ප්‍රමුඛ නැගෙනහිර යුරෝපියානු සමාජවාදී රටවල් අතර සීතල යුද්ධයක් පැවතුණු සමයේ දී, අප ජීවත්වෙන පෘථිවිය නමැති ලෝකය, එකී ධනපති රටවල්වලින් සමන්විත පළමුවන ලෝකය, සමාජවාදී රටවල්වලින් සමන්විත දෙවන ලෝකය සහ අන් සියලුම රටවල්වලින් සමන්විත තුන්වෙනි ලෝකය යනුවෙන් කොටස් තුනකට බෙදා විශ්ලේෂණය කරනු ලැබිණි.

පසු කලෙක, මේ දෙවෙනි ලෝකය ස්වභාවික මරණයකට ගොදුරුව අහෝසි වී ගිය අතර, ඊට කලින් සිට ම වාගේ තුන්වෙනි ලෝකයේ රටවල් වෙනුවට සංවර්ධනය වෙමින් පවතින රටවල් යන යෙදුම භාවිතය ඇරඹී තිබුණි. එකල සංවර්ධනය වෙමින් පවතින රටවල් යැයි හැඳින්වුණු කණ්ඩායමෙන් ද කොටසක්, මේ වන විට නව කාර්මික රටවල් යනුවෙන් වඩා ඉහළ තත්වයක ලා හැඳින්වේ.

අවාසනාවට මෙන් අපේ ලංකාව නම් තවමත් ඇතුළත් වන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවල් ගොන්නට ය.

එක් කලෙක සංවර්ධනය වෙමින් පවතින්නේ යැයි සැකකෙන රටක්, පසු කලෙක සංවර්ධනය වූ, එනම් දියුණු වූ, රටක් යැයි උසස් කිරීම සඳහා භාවිතා කළ යුතු විවිධ සමාජ ආර්ථික මිනුම් දඬු හා ඒවායේ අවම මිනුම් මේ කරුණු පිළිබඳ විශේෂඥයින් විසින් නිර්ණය කර ඇති බවට සැක නැත. **මගේ මේ වෑයම, ඒ විෂයානුබද්ධ කරුණු ගැන සාකච්ඡා කරනු වෙනුවට, සංවර්ධනය වෙමින් පවතින තත්වයෙන් සංවර්ධිත තත්වයට අවශ්‍ය පිම්ම පනින්නට නම් අපේ ශ්‍රී ලංකාවට සාක්ෂාත් කර ගත යුතු ඉතා සරල කරුණු දෙකක් ගැන කෙටියෙන් සඳහන් කරන්නයි.**

ඉන් පළමුවැන්න මෙසේය.

අප එකෙකුට අනෙකා ඔවුන් ගේ මුල් නම භාවිතා කර, විශේෂණ පද නොමැතිව ඇමතීමට හැකි දිනයක අප දියුණු රටක් වූවා වෙනු ඇත.

මා එයින් අදහස් කරන්නේ සමාජයේ පුද්ගලයින් එකිනෙකා පිළිබඳව ඇති ගෞරවය හෝ සැලකීම නැති කළ යුතු ය කියා නොව, සොක්කන් ලොක්කන්ට එතුමා, ඔබතුමා, මැතිතුමා යනාදී වචනයෙන් මූණිච්චාට හෝ බය පක්ෂපාතකම පෙන්වීමට කෙරෙන ඇමතුම් මෙන්ම, ලොක්කන් සොක්කන්ට ඕයි, තමුසේ යනාදි ලෙස කෙරෙන ඇමතුම් ද නතර වී